# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව
(නව නිර්දේශය)

**නූතන මනෝවිද්‍යාවේ මූලිකාංග හා ආගමික මනෝවිද්‍යාව BUPS – 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ආධ්‍යාත්මිකත්වය හා ආගමිකත්වය අතර පවත්නා සමවිසමතා පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

02. මානසික සෞඛ්‍යය විෂයෙහි ආධ්‍යාත්මිකත්වය හා ආගමිකත්වය තුළින් සිදුවන බලපෑම පෙන්වා දෙන්න.

03. ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය සැකෙවින් දක්වා එම සංකල්පයන් බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගත වී ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

04. මනසේ ස්ථර (Levels of Psyche) කාල් යුංගේ විශ්ලේෂණය ඇසුරින් විග්‍රහ කරන්න.

05. චර්යාවාදයේ ආරම්භකයන් දෙදෙනෙකුගේ ආකල්ප ඇසුරින් එම මනෝවිද්‍යා ගුරුකුලයේ ඉගැන්වීම් විශද කරන්න.

06. පරිසර මනෝවිද්‍යාවේ ස්වභාවය හා විෂය පථය කෙටියෙන් හඳුන්වා දෙන්න.

07. වාසයට යෝග්‍ය පරිසරයක් සඳහා ඉවහල් කරගත හැකි බෞද්ධ ඉගැන්වීම් පරීක්ෂා කරන්න.

08. ආගමෙහි ප්‍රභවය දක්වා එය ඓතිහාසික වශයෙන් සංවර්ධනය වී ඇති ආකාරය පිළිබඳ විමසීමක යෙදෙන්න.

09. පුද්ගල චර්යාවන් සංවර්ධනයෙහිලා ආගමික ඉගැන්වීම් මගින් ලැබෙන පිටුබලය පැහැදිලි කරන්න.

10. 'ඉච්ඡාභංගත්වය බොහෝ මානසික ගැටලු සඳහා ප්‍රබල හේතුවකි.' මෙම කියමන පිළිබඳ මනෝවිද්‍යානුකූල විග්‍රහයක යෙදෙන්න.

********************************